සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණ, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

45 | S | I

පැය 02 යි
**Two hours**

විභාග අංකය:.................................................................

උපදෙස් :
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ ජා.හැ.අං ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ පුටු පස දැක්වෙන උපදෙස් පරිදි (x) කතිරයක් යොදා දක්වන්න.

1. භාරතීය සමාජයෙහි තමන්ගේ ආධිපත්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා බ්‍රාහ්මණයන් විසින් හඳුන්වා දුන් ප්‍රධාන ඉගැන්වීම වන්නේ,
   1. කාන්තා නිදහස සීමා කිරීමයි
   2. අනාර්යයන්ගේ අයිතිවාසිකම් අහිමි කිරීමයි.
   3. වාර්තා ධර්ම සංකල්පය හඳුන්වා දීමයි
   4. ආශ්‍රම ධර්ම සංකල්පය හඳුන්වා දීමයි.
   5. බ්‍රහ්ම සහව්‍යතාවය අගය කිරීමයි.

2. ජීවිතයේ විවිධ අවස්ථාවන්වලදී අනුගමනය කළයුතු ක්‍රමවේදයන් බමුණන් විසින් හඳුන්වා දෙනු ලැබී ය. ඒ අනුව ''සන්‍යාසී'' ආශ්‍රමයේ දී කළ යුතු කාර්යය වූයේ,
   1. තවුස් දම් රැකීම සඳහා වනගත වීමයි.
   2. පස්කම්සුව විඳිමින් සාර්ථක ජීවිතයක් ගත කිරීමයි.
   3. බිරිඳ සමඟ චාරිකාවේ නිරත වීමයි.
   4. බ්‍රහ්ම සහව්‍යතාවය පතා අනගාරිකව හුදකලා සංචාරක ජීවිතයක් ගත කිරීමයි.
   5. උගතමනා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමයි.

3. බමුණන් විසින් හා හඳුන්වා දුන් වර්ණ ධර්ම සංකල්පය විවිධ සාධක අනුව විචාරයට ලක් කළ බුදුසමය ආචාර විද්‍යාත්මක කරුණු ඉදිරිපත් කළේ,
   1. මහා මංගල සූත්‍රයේ දී ය.
   2. වාසෙට්ඨ සූත්‍රයේ දී ය.
   3. අස්සලායන සූත්‍රයේ දී ය.
   4. අම්බට්ඨ සූත්‍රයේ දී ය.
   5. වසල සූත්‍රය දී ය.

4. ස්වධර්ම සංකල්පය යටතේ වෛශ්‍යයන්ට පමණක් පවරන ලද එකක් වන්නේ
   1. ඉගැන්වීම් හා දන්දීමයි
   2. යාග කිරීම හා ඉගෙන ගැනීමයි
   3. පසු පාලනය හා කෘෂිකර්මාන්තයයි
   4. ප්‍රජා පාලනය හා වෙළඳාමයි
   5. දන් පින් පිළිගැනීම හා යාග කිරීමයි

5. භාරතීය සමාජයෙහි සුලු රැකියා කරන ලද පිරිසක් පංචම කුලය ලෙස හඳුන්වන ලදී ඒ අතර පුක්කුස යනුවෙන් හැඳින් වන ලද පිරිසට අයත් කාර්යය වූයේ
   1. කුලු පොතු වැඩ කිරීමයි.
   2. දඩයමින් කල් ගෙවීමයි
   3. කුණු කසල අසූචි ආදිය ඉවත් කිරීමයි
   4. වාහන පැදවීම
   5. සොහොන් බිම් වල කටයුතු කිරීමයි

6. ස්වභාව නීතියට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදුවේ යැයි පවසන ලද ශාස්තෘවරයා වූයේ
   1. පූර්ණ කස්සප
   2. මක්ඛලීගෝසාල
   3. පකුධ කච්චායනය
   4. සංජය බෙල්ලට්ඨිපුත්ත
   5. නිඝණ්ට නාථපුත්ත

7. සිදුහත් බෝසතාණන් වහන්සේ පිඬුසිඟා ලබාගත් ආහාර පාණ්ඩව පර්වතය අසල දී වළඳන ලද බව සඳහන් වේ එම ආණ්ඩුව පර්වතය පිහිටා තිබුණේ
   1. මගධ රාජ්‍යයේ
   2. කෝසල රාජ්‍යයේ
   3. වතස රාජ්‍යයේ
   4. මල්ල රාජ්‍යයේ
   5. අවන්ති රාජ්‍යයේ

8. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය බුදුරජාණන් වහන්සේගේ දේශනා කළේ
   1. කොසොල් රජු අරභයා ය
   2. අජාසත්ත රජු අරභයා ය
   3. බිම්බිසාර රජු අරභයා ය
   4. උදේනි රජු අරභයා ය
   5. අනේපිඬුසිටුතුමා අරභයා ය

9. කසීභාරද්වාජ සූත්‍රය අධ්‍යයනය කිරීමනේ පැහැදිලි වන්නේ බුද්ධ කාලීන භාරතයේ
   1. දියුණු අධ්‍යාපන ක්‍රමයක් පැවතී බවයි
   2. බමුණන්ට බුදුරදුන් දහම් දෙසූ බවයි
   3. කෘෂිකාර්මික ජීවිතයක් පැවැති බවයි
   4. වප්මගුල් උත්සවය ඉතා ඉහළින් සැමරූ බවයි
   5. දියුණු වෙළෙඳ ව්‍යාපාර පැවති බවයි

10. ශාස්වත අශාස්වත අන්තද්වජයට නොපැමිණ සුන්දර වූ නිවනට ගිය බැවිනුත්, එම නිර්වාණයට යන්නන් ආකාරයෙන් ගිය බැවිනුත්, .......................... කියවිය නොහැකිය .................. වෙත යන්නන්ට කියන බැවිනුත් බුදුරජාණන් වහන්සේ,
   1. ලෝකවිදූ නම් විය
   2. සුගත නම් විය
   3. අරහං නම් විය
   4. සම්මා සම්බුද්ධ නම් විය
   5. විජ්ජාචරන සම්පන්න විය

11. බුදුරජාණන් වහන්සේ පිළිබඳව නූතන චින්තකයන් විවිධ අයුරින් ඇගයීම් සිදු කර ඇත. ඒ අතර ''ලෝකයේ ප්‍රසිද්ධ ආගම්වලින් මා බුදු දහමට විශේෂයෙන් මුල් බුදු දහමට කැමැති වන්නේ එය කිසිවකු නො පෙළනන බැවිනි.'' යනුවෙන් ප්‍රකාශ කළේ,
   1. ඇල්බට් අයින්ස්ටයින් ය.
   2. එඩ්වින් අර්නෝල්ඩ් ය.
   3. මැක්ස් මුලර් ය
   4. බර්ට්‍රන්ට් රසල් ය
   5. මහාචාර්ය සෙන්ඩර්සන් ය.

12. බුදුරජාණන් වහන්සේට ලැබෙන චීවර තමාට නො දිය යුතු යැයි ප්‍රකාශ කළ ශ්‍රාවකයන් වහන්සේ,
   1. ආනන්ද මහ රහතන් වහන්සේ ය.
   2. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.
   3. මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේ ය.
   4. අනුරුද්ධ මහ රහතන් වහන්සේ ය.
   5. සැරියුත් මහ රහතන් වහන්සේ ය.

13. බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවික ශ්‍රාවිකාවන්ගේ විවිධ කුසලතා අගයමින් අග තනතුරු ප්‍රදානය කරන ලදී. ඒ අනුව ධර්මදානය සහ අත්දැකීම් බහුලත්වය සලකා වීර............ භික්ෂුණීන් අතර අගතනතුරට පත් කළේ,
   1. පටාචාරා තෙරණින් වහන්සේ
   2. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ
   3. උප්පලවන්නා තෙරණින් වහන්සේ
   4. ඛේමා තෙරණින් වහන්සේ
   5. ධම්මදින්නා තෙරණින් වහන්සේ

14. පුද්ගලයා සිය ගැටලුවලට පිළියම් සෙවීම නිසා ආර්ථික, දේශපාලන, ආගමික හා ගෘහස්ථ සමාජ සංස්ථාව නිර්මාණය වූ බව බෞද්ධ මතයයි ඒ බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ,
   1. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයයි
   2. දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයයි
   3. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයයි
   4. සංයුක්ත නිකායේ කසීභාරද්වාජ සූත්‍රයයි
   5. සංයුක්ත නිකායේ රජ්ජ සූත්‍රය

15. සම ජීවිකාවෙන් මනා කළ කළමනාකාරීත්වයෙන් යුතුව ධනය පරිහරණය කිරීමට අද අදාල උපදෙස් ලබා දෙන සූත්‍ර දේශනාවක් වන්නේ
   1. මහා මංගල සූත්‍රයයි
   2. කූටදන්ත සූත්‍රයයි
   3. පරාභව සූත්‍රයයි
   4. වසල සූත්‍රයයි
   5. ව්‍යග්ගපජ්ජ සූත්‍රය

16. බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අධ්‍යයනය කළ පාලකයෙක් ඒ අනුව තම රාජ්‍ය පාලනය සිදුකිරීමට කටයුතු කළේය. ප්‍රජා අවශ්‍යතා පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්වූ ඔහු කාලය, ධනය, ශ්‍රමය බුද්ධිය කැප කරමින් (............................) තම යුතුකම් ඉටු කළේය ජනතාවගේ ආරක්ෂාව සහතික කළ ඔහු අපරාධ මර්දනය කළේය. සියලු රට වැසියන් තම දරුවන් සේ සලකා කටයුතු කළ ඔහුගේ ප්‍රිය වදන් වලට සවන් දීමට සියලු ජනයා රුචිකත්වයක් දැක්විය. මෙම ප්‍රකාශය අනුව එම පාලකයා කළ ප්‍රතිපත්තිය ලෙස කැපී පෙනෙන්නේ,
1. දසරාජ ධර්ම, දස සත්කාරයන් සතර සංග්‍රහ වස්තුවයි
2. සප්ත අපරිහානීය ධර්ම , පංචශීලය ප්‍රතිපත්තිය හා ලෝකපාලක ධර්මයි.
3. දස රාජ ධර්ම සතර අගති විරතිය පංචශීල ප්‍රතිපත්තියයි.
4. දස ............... පංචවීල ප්‍රතිපත්තිය හා ......................
5. සතර සංග්‍රහ වස්තු, ලෞකික ධර්ම හා පංචවීල ප්‍රතිපත්තියයි.

17. රාග ද්වේශ මෝහ සහගත ක්‍රියා නොකළ යුතු බව අවධාරණය කරන බුදුසමය පුද්ගල යහපත සඳහා ම මගපෙන්වයි ඒ අනුව කාලාම සූත්‍රය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ,
1. ජනතාව රාජ්‍ය පාලකයන්ට අවනතව ක්‍රියා කළ යුතු බවයි
2. සම්ප්‍රදායික මතවාද ගරු කරමින් තම කටයුතු සිදුකළ යුතු බවයි
3. තමන් විසින් ම ස්වාධීනව සිතා බලා යමක් තීරණය කළ යුතු බවයි
4. භාවනාව අනුව යමින් ප්‍රතිපත්තිගරුකව ජීවත් විය යුතු බවයි
5. ශක්තිමත් ආර්ථිකයක් තුළින් ජීවිතය ජයගත යුතු බවයි

18. කායික වාචික හා මානසික පවිත්‍රතාව අගය කරන බුදුසමය ඒ සඳහා දස අකුසල් වලින් වෙන් වීමේ වැදගත්කම පෙන්වා දෙයි. එහි සඳහන් අභිද්‍යාවෙන් වෙන්වීම, ව්‍යාපාදයෙන් වෙන්වීම් සහ පේසුඤ්ඤයෙන් වෙන්වීම තුළින් සිදුවන්නේ,
1. කායික පවිත්‍ර බව රැකීමයි
2. කායික හා මානසික පවිත්‍ර බව රැකීමයි
3. කායික හා වාචික පවිත්‍ර බව රැකීමයි
4. මානසික හා වාචික පවිත්‍රතාවය රැකීමයි
5. කායික වාචික හා මානසික පවිත්‍රතාව රැකීමයි

19 ගෘහස්ථ ප්‍රතිපදාවේ පදනම පංචශීලයයි. සතර පෝයට ම අෂ්ටාංග සීලය ආරක්ෂා කිරීමට උපාසක උපාසිකාවන් යොමුවී ඇත. පංචශීලයේ හා අෂ්ටාංග ශීලයේ සමාන මෙන් ම වෙනස් වූ ශික්ෂා පද පවතී ඒ අනුව පංචශීලයේ නොමැති අෂ්ටාංග ශීලයේ ඇති ශික්ෂා පද සංඛ්‍යාව වන්නේ,
1. තුනකි
2. හතරකි
3. පහකි
4. හයකි
5. හතකින්

20. බුදුදහමේ උගන්වන්නේ දිළිඳු කම හේතුවෙන් සමාජ ප්‍රශ්න රැසක් ඇති වන බවයි. එම සමාජ ප්‍රශ්න තුරන් කිරීම සඳහා රාජ්‍ය පාලකයන් විසින් අනුගමනය කළ යුතු සුදුසු ම ක්‍රියා පිළිවෙත විය යුත්තේ,
1. අපරාධකරුවන් සඳහා දඬුවම් දීමයි.
2. සමාජ ප්‍රශ්න සොයා බැලීමට කොමිසමක් පත් කිරීමයි.
3. දිළිඳුකමට හේතු සොයා බැලීමයි.
4. දිළිඳුකම තුරන් කිරීම සඳහා සුදුසු ධනෝපායන මාර්ග වැඩිදියුණු කිරීමයි.
5. බන්ධනාගාර දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමයි.

21. ''වැස්ස සොඳුරු ගැයුමකින් වසියි. මගේ කුටිය සෙවන කරන ලද්දේය. ජනෙල් දොරපියන් වලින් යුක්ත වේ. ඒ නිසා වැස්සෙන් නො තෙමේ. මනා සේ පුරුදු කළ මගේ සිතද සමාධියට පත් වේ'' යන ශෝධික මහරහතන් වහන්සේගේ ප්‍රකාශයෙන් අවබෝධ කරගත හැක්කේ,
1. රහතන් වහන්සේලා නොතෙමී සිටින බවයි.
2. රහතන් වහන්සේලා කුටි තුළ වාසය කරන බවයි.
3. රහත් වූ විට සිත සමාධිගත වන බවයි.
4. රහතන් වහන්සේ ආත්මාර්ථකාමී වූ බවයි.
5. රහතන් වහන්සේ ස්වභාව සෞන්දර්ය මගින් විරාගී වින්දනයක් ලැබූ බවයි.

22. ධනය පරිහරණය කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ බුදුසමය විවිධ සූත්‍රවලදී කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අතර තමා සුවපත් වීම සඳහාත්, තමා පිනවීම සඳහාත්, බෙදා හදා ගැනීම සඳහාත්, පින්කම් කිරීම සඳහා ධනය යොදා ගත යුතු බව සඳහන් වන්නේ,
1. මහාමංගල සූත්‍රයේය.
2. අන්න සූත්‍රයේ ය.
3. රාසිය ගාමිණී සූත්‍රයේ ය.
4. සිඟාලෝවාද සූත්‍රයේ ය.
5. පරාභව සූත්‍රයේ ය.

23. කිසියම් ආයතනයක සාර්ථකත්වය රඳා පවතින්නේ එහි කළමනාකරණය සිදු වන ආකාරයෙනි. භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බුදුසසුන් බුදු සසුනෙන් ද ආදර්ශ සපයයි ඒ වෙනුවෙන් භික්ෂූන්ට වගකීම් පවරා ඇත. ඒ අනුව ''භත්තුද්දේසක'' පත් කරනු ලැබුවේ,
1. ධාන්‍ය බෙදා දීම සඳහා ය.
2. ආහාර බෙදා දීම සඳහා ය.
3. කැඳ බෙදා දීම සඳහා ය.
4. පළතුරු බෙදා දීම සඳහා ය.
5. පාත්‍ර බෙදා දීම සඳහා ය.

24. බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීමටත් ඥාන ප්‍රතිලාභය පිණිසත් පුද්ගලයා පොලඹවන මනෝභාවයක් ලෙස අගය කළ හැක්කේ,
   1. සීලයයි
   2. සමාධියයි
   3. ප්‍රඥාවයි
   4. ශ්‍රද්ධාවයි
   5. භක්තියයි

25. බෞද්ධයාට මෙලොවදීත් පරලොවදීත් සැප විඳීම සඳහා අවශ්‍ය මග පෙන්වීම බුදුදහමින් සිදු කර ඇත. ............. සූත්‍රයේ දී මෙලොවදී අත්‍ථි සුඛයෙහි හිමිකරුවෙකු විය යුතු බව දක්වයි. එමගින් පුද්ගලයා යොමු කරන්නේ,
   1. සාධාරණව ධනය ඉපයීම සඳහා ය.
   2. කෙසේ හෝ ධනවත් වීම සඳහා ය.
   3. පින්කම් කිරීම සඳහා ය.
   4. ඉතිරි කිරීම සඳහා ය.
   5. යුතුකම් ඉටු කිරීම සඳහා ය.

26. මෙලොව ජීවිතයේ සාර්ථකත්වය සඳහා මග පෙන්වන බුදුදහම පුද්ගල පරිහානියට හා ධන පරිහානියට හේතුවන කරුණු විවිධ සූත්‍රවලදී දේශනා කර ඇත. එසේ අපාය මුඛ වශයෙන් කරුණු හයක් දේශනා කර ඇත්තේ,
   1. පරාභව සූත්‍රයේ ය.
   2. වසල සූත්‍රයේ ය.
   3. මහා මංගල සූත්‍රයේ ය.
   4. සිඟාලෝවාද සූත්‍රයේ ය.
   5. කරණීය මෙත්ත සූත්‍රයේ ය.

27. ''කම්මැලියි වූ කායික චෛතසික ලිපිය නැති කෙනෙකුගේ සියයක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීර්යයෙන් යුක්තයාගේ එක දවස ජීවත්වීම ඉතා උතුම් ය,'' යන අර්ථය ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
   1. අත්තනාව කතං පාපං ... යන්නයි.
   2. අචරිත්වා බ්‍රහ්ම චරියං ... යන්නයි.
   3. ජයං වේරං පසවතී ... යන්නයි.
   4. සහස්සම්පි චේ වාචා ... යන්නයි.
   5. යෝචේ වස්ස සතං ජීවේ ... යන්නයි.

28. සම්බුදු සසුනෙහි ධූතාංගධාරීන් අතර අගතනතුරින් පිදුම් ලද ගමින් ගමට ගොස් ධර්ම ප්‍රචාරක කටයුතුවල නියැළි වහරහතන් වහන්සේ වූයේ,
   1. මුගලන් මහ රහතන් වහන්සේ ය.
   2. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.
   3. අනුරුද්ධ මහ රහතන් වහන්සේ ය.
   4. පුණ්ණ මහ රහතන් වහන්සේ ය.
   5. මහා කච්චායන මහ රහතන් වහන්සේ ය.

29. ''ධර්මය සිතින් විතර්කනය කිරීමත්, විවරණය කිරීමත් මනසින් ප්‍රත්‍යාවේක්ෂණය කර බැලීමත් ධර්මයේ චිර පැවැත්මට උපකාරී වන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ හ. එය තේරුම්ගත් මහරහතන් වහන්සේලා විසින් සසුනේ චිර පැවැත්ම සඳහා,
   1. විවිධ පුද පූජා ක්‍රම හඳුන්වා දෙන ලදී.
   2. වනගතව භාවනා කරන ලදී.
   3. පිරිත් සූත්‍ර දේශනා වනපොත් කරන ලදී.
   4. ධර්ම ප්‍රචාරයෙහි නිරතවන ලදී.
   5. ධර්ම සංගායනා පවත්වන ලදී.

30. ශාසන ඉතිහාසයට අනුව ප්‍රථම ධර්ම සංගායනාව පවත්වා අවසානයේ ධර්ම විනය ආරක්ෂා කරමින් පවත්වාගෙන යාම සඳහා මහරහතන් වහන්සේලාට පවරන ලදී. ඒ අනුව අංගුත්තර නිකාය ආරක්ෂාකර පවත්වාගෙන යාම සඳහා පවරන ලද්දේ,
   1. ආනන්ද මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
   2. සැරියුත් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
   3. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
   4. අනුරුද්ධ මහරහතන්වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
   5. සියලු තෙරුන් වහන්සේලාටයි.

31. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් පවත්වන ලද තෙවන ධර්ම සංගීතියෙන් පසු බුදු දහමේ සීඝ්‍ර ව්‍යාප්තිය සඳහා හේතු වූයේ,
   1. කථාවත්ථුප්පකරණය රචනා කිරීමයි.
   2. අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීමයි.
   3. දුසිල් භික්ෂූන් සසුනෙන් නෙරපා දැමීමයි.
   4. විනයකර්ම නැවත ආරම්භ කිරීමයි.
   5. නව රට සසුන් පිහිටුවීමයි.

32. කාශ්මීරය, සාර්බාණ්ඩ්, බෝවාන්, චීන තුර්කිස්ථාන් යන භාරතයෙන් පිට ප්‍රදේශ ආක්‍රමණය කොට තම පාලනයට නතු කරගත් පාලකයා ලෙස සඳහන් වන්නේ,
   1. කණිෂ්ක රජුය.
   2. ධර්මාශෝක රජුය.
   3. අනුරුද්ධ රජුය.
   4. බිම්බිසාර රජුය.
   5. කොසොල් රජු ය.

33. චීන ජාතික හියුං සියැං හිමියන්ගේ භ්‍රමණ වෘත්තාන්තයේ සඳහන් පරිදි භික්ෂූන් 6000 ක් පමණ වසන සංඝාරාම සියයක් පමණ ද නා නා දේව භක්තිකයන්ගේ දේවස්ථාන සිය ගණනක් ද පැවතියේ,
1. නාලන්දා විශ්ව විද්‍යාලය ප්‍රදේශයේ ය.
2. වික්‍රමශිලා විශ්ව විද්‍යාල ප්‍රදේශයේ ය.
3. වලභි විශ්ව විද්‍යාල ප්‍රදේශයේ ය.
4. තක්ෂිලා විශ්ව විද්‍යාල ප්‍රදේශයේ ය.
5. ජගද්දලා විශ්ව විද්‍යාල ප්‍රදේශයේ ය.

34. මහාවංශයේ සඳහන් තොරතුරු අනුව ප්‍රාග් බෞද්ධ ලංකාවේ විවිධ ඇදහිලි හා විශ්වාස පැවති බව පෙනේ. ඒ් අතර යක්ෂ යක්ෂණීන් ඇදහීම ද විය. එය ජනප්‍රිය ඇදහිල්ලක් බවට පත් වීම නිසා පණ්ඩුකාභය රජු ද දේවාල ඉදි කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස නුවරින් නැගෙනහිර දිසාවෙහි දෙවොලක් ඉදි කළේ,
1. කාලවේල යක්ෂයා වෙනුවෙනි.
2. චිත්තරාජ යක්ෂයා වෙනුවෙනි.
3. වලවාමුඛි යක්ෂණිය වෙනුවෙනි
4. මහේජ යක්ෂයා වෙනුවෙනි
5. ජුතින්දර යක්ෂයා වෙනුවෙනි.

35. මහින්දාගමනයෙන් පසු ලක්දිව බුදුදහම ප්‍රචලිත විය. එහි ප්‍රති ප්‍රතිඵලයක් ලෙස රජුගේ අනුශාසක වරයා ලෙස බෞද්ධ භික්ෂූන් පත් විය. ඒ අනුව දුටුගැමුණු රජුට අනුශාසනා කළේ,
1. මිහිඳු මහා මහරහතන් වහන්සේ ය.
2. යෝධගත්ත තිස්ස තෙරණුවෝ ය.
3. මහානාග තෙරණුවෝ ය.
4. භාතිස්ස තෙරණුවෝ ය.
5. සංඝමිත්‍රා තෙරණුවෝ ය.

36. අනුරාධපුරයේදී රජවරු පත් කිරීමටත් රජවරු සිහසුනන්ගේ නෙරපා හැරීමටත් බෞද්ධ භික්ෂූන් ඉදිරිපත් වූ අවස්ථා වාර්තා වෙයි. ඒ අනුව සද්ධාතිස්ස රජු ගෙන් පසුව ථූපාරාමයට රැස්වූ භික්ෂූන් විසින් ලජ්ජිතිස්ස නෙරපීමෙන් පසුව රාජාභිෂේකයට පත්කළේ,
1. දුටුගැමුණු කුමරුය.
2. සද්ධාතිස්ස කුමරුය.
3. ධාතුසේන කුමරුය.
4. අග්බෝ කුමරුය.
5. ථුල්ලත්ථන කුමරුය.

37. ලක්දිව බුදු දහම මුල් බැස ගැනීමෙන් පසු මුලින් ම බෞද්ධ භික්ෂුවකට පෞද්ගලික ආරාමයක් ලෙස පූජා කරනු ලැබුවේ,
1. අභයගිරි විහාරයයි.
2. ජේතවන විහාරයයි.
3. දක්ඛිණගිරි විහාරයයි.
4. ලංකාරාම විහාරයයි.
5. ථූපාරාම විහාරයයි.

38. අනුරාධපුරය යුගයේ පාලකයන් විසින් බෞද්ධ ආරාම සංවර්ධනය සඳහා විවිධ ක්‍රියා මාර්ග යොදන ලදී. ඒ අනුව අභයගිරියේ ප්‍රයෝජනය සඳහා ගාමිණී තිස්ස ජලාශය තනවන ලදී. එය සිදු කළේ,
1. වළගම්බා රජතුමා විසිනි.
2. මහසෙන් රජතුමා විසිනි.
3. ගජබා රජතුමා විසිනි.
4. කණිට්ඨතිස්ස රජතුමා විසිනි.
5. සිරිමෙවන් රජතුමා විසිනි.

39. ලක්දිව වෛතුල්‍යවාදී මත ව්‍යාප්ත කිරීම නිසා ථෙරවාද හා මහායාන මත ගැටුම් ඇති වීමේ ප්‍රතිඵලයක් ලෙස වෛතුල්‍යවාදී මත දැරූ භික්ෂූන්ට කායික දඬුවමක් දී මෙරටින් නෙරපා හරිනු ලැබුවේ,
1.වළගම්බා රාජ්‍ය සමයේ දී ය.
2. ගෝඨාභය රාජ සමයේ දී ය.
3. කිත්සිරි මෙවන් රාජ්‍ය සමයේ දී ය.
4. විජයබා රාජ්‍ය සමයේදී ය.
5. ජෙට්ඨ තිස්ස රාජ්‍යය සමයේ දී ය.

40. මුලදී සියම් නිකාය පමණ පැවතියත් පසුව මහා නිකාය හා ධම්ම යුක්තික නිකාය ලෙස කොටස් දෙකකට භික්ෂු සාසනය බිඳී ගියේ
1. තායිලන්තයේ ය.
2. මියන්මාරයේ ය.
3. ජපානයේ ය.
4. චීනයේ ය.
5. ඉන්දියාවේ ය.

41. ෂප්පට හිමි ගුරු බුරුමයේ සිට ලක්දිවට පැමිණි අධ්‍යයනය ලබා නැවත බුරුමයට ගොස් සිංහල සංඝ නමින් නිකායක් ඇති කළේ ය. එය සිදුවූයේ
1. ධම්ම චේතිය රාජ්‍ය සමයේ ය.
2. බෝධෝපයා රාජ්‍ය සමයේ ය
3. මින්දොන්මින් රාජ්‍ය සමයේ ය.
4. අනුරුද්ධ රාජ්‍ය සමයේ ය.
5. කෙසංසිත්ථ රාජ්‍ය සමයේ ය.

42. ක්‍රිස්තු වර්ෂ (6) වන සියවසේදී චාන්සෙන් හෙවත් ධ්‍යාන සම්ප්‍රදාය මගින් චීන ජනතාවගේ ආධ්‍යාත්මික ශක්තිය අවදි කිරීම සිදු කළේ,
1. පරමාර්ථ හිමියන් විසිනි.
2. කුමාරජීව හිමියන් විසිනි.
3. හියුං සියැං හිමියන් විසිනි.
4. කාශ්‍යප මාතංග හිමියන් විසිනි.
5. බෝධිධර්ම හිමියන් විසිනි.

43. ක්‍රි.ව. 433 දී චීනයේ භික්ෂුනී ශාසනය ආරම්භ කිරීමට මූලික වූයේ,
1. දේවසාරා භික්ෂුනීන් වහන්සේ ය.
2. නන්දා භික්ෂුණීන් වහන්සේ ය.
3. පදුම භික්ෂුණීන් වහන්සේ ය.
4. සුනන්දා භික්ෂුණීන් වහන්සේ ය.
5. ධම්මදින්නා භික්ෂුණීන් වහන්සේ ය.

44. ජපානයේ රාජ්‍ය ආගම බවට බුදුදහම පත් කිරීමේ ගෞරවය හිමි කර ගත්තේ,
   1. යොමයි අධිරාජයා ය.
   2. සුයිකෝ අධිරාජ්‍යයා ය.
   3. ෂෝතෝකු තයිෂි අධිරාජයා ය.
   4. කිම්මෙයි අධිරාජයා ය.
   5. කම්මු අධිරාජයා ය.

45. ලෝකයේ පැරණි ම දැව මුවා ගොඩ ගොඩනැගිල්ල ලෙස සලකනු ලබන්නේ,
   1. හෝර්යුජි විහාරයයි.
   2. හෝකෝජි විහාරයයි.
   3. යකුෂිජි විහාරයයි.
   4. තෝදයිජි විහාරයයි.
   5. ධවල අශ්වාරාම විහාරයයි.

46. ජපානයේ බෞද්ධ ජනයා විවිධ උත්සව සමරයි. ඒ අතර ''ජෝදා'' නම් උත්සවය පවත්වනු ලබන්නේ,
   1. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිහිකිරීම සඳහා ය.
   2. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව වූ දිනය සිහි කිරීම සඳහා ය.
   3. බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන්පෑම සිහිපත් කිරීම සඳහා ය
   4. මළවුන් පිදීම සඳහා ය
   5. සුඛාවතී නම් බුද්ධ ක්ෂේත්‍රයට නමස්කාර කිරීම සඳහා ය

47. බුද්ධ ප්‍රතිමාවල මුද්‍රා පරීක්ෂා කිරීමේදී දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන එහි මාපට ඇඟිල්ල හා දබර ඇඟිල්ල  කවයක් සෑදෙන සේ එකට තබා ඇතුලට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් නිර්මාණයය කළ මුද්‍රාවක් දැකිය හැකිය. එය හඳුන්වන්නේ,
   1. අභය මුද්‍රාව නමිනි.
   2. විතර්ක මුද්‍රාව නමිනි.
   3. ධර්මචක්‍ර මුද්‍රාව නමිනි.
   4. භූමිස්පර්ශ මුද්‍රාව නමිනි.
   5. වරද මුද්‍රාව නමිනි.

48. ස්තූප ඉදිකිරීම බුදු බුදුරජාණන් වහන්සේ විසින් ද අනුදැන වදාළහ. ඒ අනුව සම්මා සම්බුද්ධ පච්චේක බුද්ධ හා සක්විති රජු වෙනුවෙන් ස්තූප ඉදිකිරීම සුදුසු බව ආනන්ද හිමියන්ට දේශනා කළ බව සඳහන් වේ. ඒ බව සඳහන් මූලාශ්‍රය වන්නේ,
   1. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයයි.
   2. දීඝ නිකායේ මහා නිදාන සූත්‍රයයි.
   3. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයයි.
   4. දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයයි.
   5. දීඝ නිකායේ මහා සුදස්සන සූත්‍රයයි.

49. ලක්දිව චිත්‍ර කලාව පිළිබඳ තොරතුරු සෙවීමේ දී විවිධ යුගවලට අයත් චිත්‍ර කලාවන් හමුවේ. අනුරාධපුර යුගයට අයත් සිතුවම් දැකිය හැකි පූජනීය ස්ථාන ලෙස හඳුනාගෙන ඇත්තේ,
   1. හිඳගල විහාරය, රුවන්වැලි සෑ ධාතු ගර්භය, මිරිසවැටිය හා ජේතවනය යි
   2. දෙගල්දොරුව, දඹුල්ල විහාරය හා මැදවල විහාරය
   3. මහියංගන ස්තූපය දිඹුලාගල පුල්ලිගොඩ හා තිවංක පිළිමගෙය
   4. කැලණියේ අලුත් විහාරය, බොරැල්ලේ ගෝතමී විහාරය, බෙල්ලන්විල රාජමහා විහාරස්ථානය හා මැද්දෙපොල විහාරය
   5. මාවිල සුමන කුසුමාරාමය, ගඩලාදෙණිය දිඹුලාගල හා සේදවත්ත විහාරය

50. ඈත අතීතයේ පටන් නොව මෑත යුගයේද දී ද ගද්‍ය පද්‍ය සාහිත්‍ය රචනා ජාතක පාලියේ කතාන්තර යොදාගත් බවට සාධක ඇත. සත්තුභත්ත ජාතකය ඇසුරු කර ගනිමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,
   1. කව්සිළුමිණයි.
   2. උමන්දාවයි.
   3. සසදාවතයි.
   4. මුවදෙව්දාවතයි.
   5. කාව්‍ය ශේඛරයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණ, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**
**Buddhist Civilization - II**

**45 S II**

පැය 03 යි
**Two hours**

විභාග අංකයඃ.......................................................................

උපදෙස්ඃ
- I කොටසින් ප්‍රශ්න (2) ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 කි. (1) (2) (3) ප්‍රශ්න වල එක් කොටසකට ලකුණු 4 බැගින් ද (4) (5) (6) (7) (8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින් ද හිමිවෙයි

## I කොටස

1. i. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව වෛශ්‍ය වර්ණයට නියමිත වූ ස්වධර්ම නම් කරන්න.
   ii. ආපත් ධර්ම හඳුන්වන්න.
   iii. බෞද්ධ නොවන ශ්‍රමණ ගුරුකුල හතරක් සැකෙවින් හඳුන්වන්න.
   iv. පූර්ණ කාශ්‍යප ශාස්තෘවරයාගේ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.
   v. බුද්ධ කාලීන භාරතයේ මගධ රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

2. i. බුදුරජාණන් වහන්සේ සතු වූ අෂ්ට විද්‍යා නම් කරන්න.
   ii. තාදී ගුණය නිදසුන් දෙකක් ඇසුරෙන් හඳුන්වන්න.
   iii. ශාසනික උන්නතිය සඳහා අනේපිඬු සිඩුසිටුතුමාගෙන් සිදු වූ සේවය කෙටියෙන් දක්වන්න. ''න භජේ පාපකේ මිත්තේ..'' යනාදී ධම්ම පද ගාථාව හා එහි තේරුම නිවැරදිව ලියන්න. සදිසා සංග්‍රහයට අනුව දකුණු දිසාව නියෝජනයේ යුතුකම් හා වගකීම් නම් කරන්න.

3. i. දස අකුසල් නිවැරදිව නම් කරන්න.
   ii. සිව්බඹ විහරණ හඳුන්වන.
   iii. බුදු දහමෙහි උගන්වන ශ්‍රද්ධාව සැකෙවින් හඳුන්වන්න.
   iv. චෛතිය සර පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   v. හොඳ නරක විනිශ්චය සඳහා යොදාග හැකි බෞද්ධ නිර්ණායක හතරක් ගෙනහැර දක්වන්න.

## II කොටස

4. i. වර්තමානයේ දැකිය හැකි පාරිසරික ගැටලු අවම කර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් උප උපයෝගී කර හැකි දැයි විමර්ශනය කරන්න.
   ii. සම්පත් කලමනාකරණය පිළිබඳ ව සැලකිලිමත් වීමේදී බෞද්ධ ඉගැන්වීම්වල ඇති උපයෝගීතාව පරීක්ෂා කරන්න.
   iii. ''බෞද්ධ දේශපාලන මූලධර්ම සකස් වී ඇත්තේ සමාජ සුබසාධනය අරමුණු කරගෙනයි'' මෙම අදහස විමර්ශනය කරන්න.
   v. පාලන තන්ත්‍ර විෂයෙහි ප්‍රජාවගේ වගකීම කෙබඳු විය යුතු දැයි පැහැදිලි කරන්න.

5. i. දෙවන ධර්ම සංගීතියට පාදක වූ කරුණු හඳුන්වා එහි ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි කෙසේ බලපෑවේදැයි පැහැදිලි කරන්න.
   ii. නාලන්දා විශ්වවිද්‍යාලය පිළිබඳ හැඳින්වීමක් කර එහි අධ්‍යාපනය සාර්ථක වීම සඳහා බලපාන ලද සාධක පැහැදිලි කරන්න.

7. i. මහින්දාගමනය නිසා එතෙක් ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස සඳහා නව අර්ථකථන ලැබුණු ආකාරය පෙන්වා දෙන්න.
   ii. අනුරාධපුර යුගයේ රාජ්‍යත්වය කෙරෙහි බුදු සමයේ බලපෑම කෙබඳු දැයි පරීක්ෂා කරන්න.

8. i. ථායි ජන ජීවිතයෙ කෙරෙහි බුදු සමයේ බලපෑම විමර්ශනය කරන්න.
   ii. බෞද්ධ සාරධර්ම සමාජගත කිරීමට සිතුවම් කලාව ප්‍රබල මාධ්‍යයක් ලෙස යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

Answer

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණ, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

45 | S | I, II

පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 3 | 2. 4 | 3. 5 | 4. 3 | 5. 5 | 6. 2 | 7. 1 | 8. 2 | 9. 3 | 10. 2 |
| 11. 4 | 12. 1 | 13. 2 | 14. 3 | 15. 5 | 16. 1 | 17. 3 | 18. 4 | 19. 4 | 20. 4 |
| 21. 5 | 22. 3 | 23. 2 | 24. 4 | 25. 1 | 26. 4 | 27. 5 | 28. 2 | 29. 5 | 30. 4 |
| 31. 5 | 32. 1 | 33. 3 | 34. 1 | 35. 2 | 36. 5 | 37. 1 | 38. 3 | 39. 2 | 40. 1 |
| 41. 4 | 42. 5 | 43. 1 | 44. 3 | 45. 1 | 46. 2 | 47. 3 | 48. 4 | 49. 2 | 50. 5 |

### ii කොටස

1. i. පශු පාලනය, දන්දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළදාම, මුදල් පොලී කිරීම, කෘෂිකර්මාන්තය.

ii. හදිසි විපත්ති ලෙස බලපාන පොදු ආපදාපන්න තත්ත්වයන් හෝ ඒ ඒ වර්ණ වල සාමාජිකයන්ට තම වර්ණයට නිය නියමිත කට කටයුතු කිරීමට නොහැකි වූ කිසියම් ශාරීරික පීඩාවක් ඇති වූ අවස්ථාව ආපදාපන්න අවස්ථා ලෙස හඳුන්වයි. එවැනි අවස්ථාවලදී කිරීමට නිර්දේශ කළ කාර්යයන් ''ආපත් ධර්ම'' ලෙස හඳුන්වයි.

- ♦ බ්‍රාහ්මණයාට තමාට වඩා පහත් ක්ෂත්‍රිය හා වෛශ්‍යයන්ට නියමිත කාර්යයන්හි නිරත විය හැකි ය.
- ♦ ක්ෂත්‍රියන්ට තමාට වඩා පහත් ශ්‍රේණියක වූ වෛශ්‍යයන්ට හිමි කාර්යයන් කළ හැකිය.
- ♦ වෛශ්‍යයන්ට තමාට වඩා පහත් වූ ක්ෂුද්‍ර යන්ට හිමි කාර්යයයන් කළ හැකිය.
- ♦ ක්ෂුද්‍රයන්ට විශේෂ කාර්යයක් නොවූයේ මෙහි අවරෝහන පටිපාටිය ක්‍රියාත්මක වූ නිසාය.

iii. නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජක වැනි බෞද්ධ නොවන වෙනත් ශ්‍රමණ සාමාජිකයන් පිළිබඳ කෙටි හැඳින්වීමක් අපේක්ෂා කෙරේ.

iv. ♦ සාමඤ්ඤ ඵල සූත්‍රය පදනම් කර කරගෙන පිළිතුර සකස් විය යුතුය.

- ♦ පූර්ණ කස්සප අකිරිය වාදියෙකි, භෞතිකවාදියෙකි.
- ♦ කරන්නකු කරවන්නකු විදින්නකු විඳවන්නකු නැතැයි යන දර්ශනය අකිරියවාදයයි.
- ♦ සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැතැ යි උගන්වයි (නත්ථි පාපස්ස ආගමො)
- ♦ දන්දෙමින්, දන් දෙවමින්, ආගම යදිමින් යදවමින් ගංගා තීරයේ උතුරු කෙළවර තෙක් ගියත් එයින් පිනක් නැතැයි (නත්ථි පුඤ්ඤස්ස ආගමො) ඔහු ගන්වා ඇත.

v. රජගහනුවර මධ්‍යයේ අගනුවර විය. බිම්බිසාර හා අජාසත්ත යන රජවරු බුද්ධ කාලීන පාලකයන් විය.

- ♦ අංග කාසි වජ්ජී රාජ්‍යය ද යටත් ප්‍රදේශ බවට පත්විය.
- ♦ වේභාර වේපුල්ල ගිජ්ජකූට පාණ්ඩව යන පර්වත පහකින් යුක්ත වූ නිසා ගිරිබජ්ජ යන නමින් ද ප්‍රකට විය.
- ♦ රාජාණ්ඩු පාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය.
- ♦ පළමු ආරාම පූජාව වේළුවනාරාමයයි.
- ♦ බුදුරදුන් සමග මගධ රාජ්‍ය සබඳතා පැවැත්විය. (ලකුණු 4X5=20)

2. i.

| | |
|---|---|
| විපස්සනා ඤාණය | මනෝමය සෘද්ධි ඤාණය |
| ඉද්ධිවිධ ඤාණය | දිබ්බසෝත ඤාණය |
| පරචිත්ත විජානන ඤානය | පුබ්බේනිවාසානුස්සති ඤාණය |
| දිය්‍යාබචක්ඛු ඤාණය | ආසවක්ඛය ඤාණය |

ii. ලෝක ධර්මතා විෂයෙහි කම්පා නොවී උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමේ හැකියාවයි.
අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණකි.
ලාභ අලාභ, යස අයස, නින්දා ප්‍රශංසා, සැප දුක යන අටලෝ දහමට බුදුරදුන් මුහුණ දුන් ආකාරය නිදසුන් මගින් දැක්වීම අවශ්‍ය වේ.

iii. බුදු රජාණන් වහන්සේ ඇසුරු කිරීම නිසා සැදැහැවත් බෞද්ධයකු බවට පත් විය.
- ජේතවනාරාමය සඟ සතු කර පූජා කිරීම
- දන් දීමේ ඇලුණු උන් අතර අග තනතුර ලැබීම,
- අනතිමානී කම, නිර්ලෝභී කම, ශාසන ලැදියාව හා ඥාති මිත්‍රාදීන් ආගම දහමට යොමු කිරීමට උත්සාහ කිරීම අගය කළ යුතුය

| | |
|---|---|
| iv. න භජේ පාපකේ මිත්තේ | පව්ටු කාර්ක මිතුරන් ඇසුරු නොකළ යුතුය. |
| න භජේ පුරිසා ධමේ | අධම පහත් මිනිසුන් ඇසුරු නොකළ යුතුය. |
| භජේථ මිත්තේ කල්‍යාණෙ | කල්‍යාණ මිතුරන් ඇසුරු කළ යුතුය. |
| භජේත පුරිසුත්තමේ | උතුම් මිනිසුන් ඇසුරු කළ යුතුය. |

v. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම්
1. ගුරුවරයා දුටු විට හුන් අසුනින් නැගිටීම
2. ගුරුවරයාට උපස්ථාන කිරීම
3. ගුරු බස්ට මැනවින් සවන්දීම
4. ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටු කර දීම
5. මැනවින් ශිල්ප ඉගෙනීම

ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම්.
1. ශිෂ්‍යයා මැනවින් හික්මවීම
2. ශිෂ්‍යයාට මැනවින් ඉගැන්වීම
3. තමා දන්නා සියලු ශිල්ප ශාස්ත්‍රයන් ඉගැන්වීම
4. තම මිත්‍ර ජනයාට ශිෂ්‍යයා හඳුන්වාදීම
5. ශිෂ්‍යයා කරදරවලින් ආරක්ෂා කිරීම

(ලකුණු 4X5=20)

3. i. ප්‍රාණඝාතය, අදත්තාදානය, පරදාර සේවනය, මුසාවාදය, කේළාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය.

ii.
- මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා, යන සිව් බඹ විහරණ බව
- සීමාවකින් තොරව වැඩිය යුතු බැවින් මෙම ගුණධර්ම අප්පමඤ්ඤා නමින් හඳුන්වයි.
- සමාජ සහජීවනයට උපකාරී වෙයි
- ගිහි පැවිදි දෙපක්ෂයම ශක්ති ප්‍රමාණයෙන් බ්‍රහ්ම විහාර ප්‍රගුණ කළ යුතුය.

iii.
- ආකාරවතී සද්ධාව හා අමූලිකා සද්ධාව ලෙස ප්‍රභේද දෙකකි.
- තෙරුවන් පිළිබඳ පැහැදීම ප්‍රසාදය ශ්‍රද්ධාවයි
- බුද්ධාදී රත්නත්‍රයේ ගුණ දැන් අවබෝධයෙන් ඇතිකර ගන්නා පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාවයි
- අමූලික ශ්‍රද්ධාව භක්තිය හා සමානයි බුදුසමය එය අගය නොකරයි. එය නිවන්ට බාධාවකි
- බුදු දහම අගය කරන සද්ධාව ප්‍රඥාවෙන් තොර වූවක් නොවේ.

iv.
- කුඩා හා මධ්‍ය පරිමාණයේ ස්තූපයන්හි ආරක්ෂාව සඳහා ගල් කණු වලින් වට කොට ඒ මත පියස්සක් තනා ඉදිකළ වෘත්තාකාර ගෘහය චේතිය ඝර ථූපඝර යන නම්වලි වලින් හඳුන්වයි.
- ථූපාරාමය, ලංකාරාමය, අම්බස්තලය වැනි කුඩා ස්තූප වල චෛත්‍යඝර ඉදිකර තිබූ බවට සාධක ඇත.
- චේතියඝරය නමින් හඳුන්වයි.
- මැදිරිගිරිය වටදාගෙය කලාත්මක නිර්මාණයක් ලෙස පිළිගැනේ
- මෙම නිර්මාණය නිසා ස්තූපයේ ආරක්ෂාව මෙන්ම සැදැහැවතුන්ට අව්වෙන් වැස්සෙන් ආරක්ෂා වී වැඳුම් පිදුම් කිරීමට හැකියාව ලැබේ.

v.
- යමක් කුසල් ද අකුසල් ද යන්න තමන් වී විසින් දැන් ගැනීම.
- නුවණැත්තන් විසින් ගර්හාවට ලක් කරයිද ප්‍රශංසාවට ලක් කරයි ද යන්න වටහා ගැනීම් (විඤ්ඤූගරහිත විඤ්ඤූපපත්ථ)
- අධිපති ධර්ම අනුව:- අත්තාධිපති ලෝකාධිපති, ධර්මාධිපති,
- අත්තූපනායික ධර්ම පර්යාය (තමා උපමාවට ගෙන කටයුතු කිරීම)
- ප්‍රතිඵල යහපත් ද අයහපත් දැයි බලා තීරණය කිරීම
- අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය ඇසුරෙන් කරුණු දැක්වීම.

(ලකුණු 4X5=20)

4. i.
- වර්තමානයේ පාරිසරික ගැටලු ලෙස ජල දූෂණය, වායු දූෂණය, වන විනාශය, කැළි කසළ ගොඩ ගැසීම හඳුනාගත හැකිය. එමගින් ජීවන දුෂ්කරතා සිදුවේ.
- පිරිසිදු ජලය නොමැති වීම ද ගැටලුවකි.
- සරිසර සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් බොහෝ ඇත. ජලයට මුත්‍රා කිරීම, කෙළ ගැසීම, මළ පහ කිරීම තහනම්

කර ඇත. (පාචිත්තිය පාලිය)
- ගස් කැපීම, බීජ විනාශ කිරීම, කොළ කැඩීම ආදිය උපසම්පදා භික්ෂූන්ට තහනම් කර ඇත (පාචීන පාලිය)
- නොකළ යුතු වෙළඳාම් කිරීම තුළින් පරිසර සංරක්ෂණයට බාධා සිදුවේ.
- පරිසර සංරක්ෂණය පින් වැඩෙන කුසල ලෙස වනරෝප සූත්‍රයේ සඳහන් කර ඇත.
- බුදුරජාණන් වහන්සේ ද රහතන් වහන්සේලා ද පරිසරය ප්‍රිය කර ඇත.

ii. ♦ භෞතික හා මානව සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගැනීම කළමනාකරණයයි
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සාමාජික තාවය තුළින් භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳව මගපෙන්වයි
- සිගාලෝවාද සූත්‍රයේ දී ආර්ථික කළමනාකරණය පිළිබඳ මඟ පෙන්වයි (ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය)
- චුල්ලවග්ග පාලියේ වත්තක්ඛන්ධකයේ ආගන්තුක වත, පිණ්ඩ චාරික වත ආවාසිකවත, සේනාසන වත, වචන ටිකටි වත ආදී වතාවත් තුළින් ද සම්පත් කළමනාකරණය පිළිබඳව භික්ෂූන්ට මගපෙන්වා ඇත.
- භික්ෂූන් උදෙසා සාංඝිකව ලැබෙන සම්පත් අවශ්‍යතා මත සුදුසු භික්ෂූන්ට පැවරීම.
- භෞතික සම්පත් මැනවින් කළමනාකරණය කිරීම් සඳහා භාණ්ඩාගාරික භත්තුද්දේසක විභජ්ජක, චීවර පටිග්ගහන පත්තගහාපක ආදී තනතුරු රැසක් භික්ෂු සමාජය තුළ ඇති කළේ ය. මානව සම්පත් කළමනාකරණය ද බුදුරදුන් මැනවින් සිදු කළ බව ප්‍රථම ධර්මදූත සේවාව සඳහා ලබාදුන් උපදේශනයෙන් ද පෙනේ. (චරක භික්කවේ චාරිකං...)

(ලකුණු 10)

5. i. ♦ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව මහා සම්මත පත් කරන්නේ ජනතාවගේ ආරක්ෂාව හා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහාය
- ශ්‍රේෂ්ඨ පාලකයකු විසින් අනුගමනය කළ යුතු පාලන මුල් මූලධර්ම රැසක් බුදු දහමෙහි සඳහන් කර ඇත.
- පංචශීල ප්‍රතිපදාව දසරාජ ධර්මය, දස සක්විති වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය හා මූලධර්ම වැදගත් වේ.
- මෙම මූලධර්ම වලින් සමාජ සුභ සුබසාධනය අරමුණු කර ඇත. (ලකුණු 10)

ii. ♦ රටක් දියුණු කිරීමේදී පාලකයා පමණක් නොව ජනතාවට ද වැදගත් කාර්ය කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවෙයි.
- අග්ගඤ්ඤ සූත්‍රයේ රජුන් පත් කිරීමේ පළමු සම්මුතියෙහි පොරොන්දුවී ඇත්තේ (අම්හා කං සාලිනං භංගං අනුප්පදස්සාමි) යනුවෙනි. ජනතාව නිසි පරිදි බදු ගෙවිය යුතු බව ඉන් කියවේ.
- තමන්ගේ ආර්ථික ස්වයං පෝෂණය සඳහා උත්සාහයෙන් අධිෂ්ඨානයෙන් ක්‍රියා කිරීම ජනතාවගේ වගකීමයි.
- පොදු දේපොළ නොසැලකිල්ලෙන් පරිහරණය නොකළ යුතුය.
- රාජ්‍ය දේපළ අයථා පරිහරණය හා අව භාවිතයෙන් තොර විය යුතුය.
- සම්පත් අධිපරිභෝජනය වැළකී සම්පත් ආරක්ෂා කිරීම ජනතා වගකීමකි.
- ආත්මාර්ථයෙන් තොරව සමාජ සුභ සිද්ධිය පිළිබඳව අවබෝධයෙන් ක්‍රියා කළ යුතුයි. (ලකුණු 10)

6. i. ♦ චුල්ලවග්ගපාලියේ සත්ත සතිකක්ඛන්ධකං අනුව දෙවන ධර්ම සංගීතියට ආසන්න හේතුව වූයේ වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දස වස්තුවයි.
- පාචීනක, පාවෙය්‍යක යන ප්‍රදේශ දෙකෙන් ධර්ම ධර, විනය ධර භික්ෂූන් වහන්සේ කිනම් ප්‍රදේශයේ ද යන ගැටලු ද මතු විය.
- බුද්ධ ක්ෂේත්‍ර පිළිබඳ ගැටලු ඇති විය.
- මහාදේව හිමියන් ඉදිරිපත් කළ පංචවස්තුව ද හේතු වූ බව නිකායාවලම්බන ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ සඳහන් වේ.
- දෙවන ධර්ම සංගීතියේ ප්‍රදානම ප්‍රථිපලය වූයේ වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දස වස්තුව සබ්බකාමී මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රැස්වූ සංඝ සම්මේලනයේදී ධර්ම විනය විරෝධී අකැප වස්තුවක් සේ එකින් එක විශ්ලේෂණය කර ප්‍රතික්ෂේප කිරීමයි.
- දස වස්තු ප්‍රතිග්‍රහක දස දහසක් භික්ෂූන් අලජ්ජි පාපී භික්ෂූන් ලෙස නිගමනය කොට සසුනෙන් නෙරපීය.
- වජ්ජිපුත්තක භික්ෂූන් වෙන්ව ගොස් මහා සාංඝික නමින් වෙනම නිකායක් පිහිටුවීය.
- ථෙරවාදී හා මහා සාංඝික නිකා දෙක තුළින්ද තවත් නිකා බෙදී ගියේය.
- නැවත මහා සාංඝිකයන් නිකාය (6) කට ද ථෙරවාදී නිකාය (12) කට ද ලෙස නිකාය 18 කට බෙදී ගියේය.
- මහායාන බුදුදහමේ මූලාරම්භය දෙවන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් අනුව සිදුවිය. (ලකුණු 10)

ii. ♦ ක්‍රිස්තු වර්ෂ 415 - 455 කාලයේ රජ කළ ආදිත්‍ය හෙවත් පළමුවන කුමාරගුප්ත රජු නාලන්දාවට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකර උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් කළේය
- බුද්ධගුප්ත තථාගත ගුප්ත යන රජවරු ද නාලන්දාව දියුණු කළේය.
- ක්‍රි.ව. හත්වන සියවස වන විට දස දහසකට නේවාසික පහසුකම් පැවැතියේ ය.
- හියුංසියැං අනුව සංඝාරාම හයකින් යුක්ත වූ මේ ආයතනය උස් තාප්පයකින් වට කොට තිබිණි තට්ටු (9) කින් හා මන්දිර තුනකින් යුතු පුස්තකාලය රත්න සාගර, රත්නෝදය රත්න රංජන, නම්වලින් හඳුන්වා ඇත.
- ආචාර්ය ශිෂ්‍ය සේවක යන නේවාසික පිරිස් (10,000) කට අධික වූ අතර එක්දහස් පන්සියයකට අධික සේවක පිරිසක් සිටි බව හියුං සියැං වාර්තා වල සඳහන් වෙයි.
- අධ්‍යාපනය අංශ තුනක් යටතේතේ සිදුවිය.
- ද්වාර පණ්ඩිතවරු මගින් ප්‍රවේශ විභාගයකින් සිසුන් තෝරා ගනු ලැබීය.
- ඉගෙනුම් ක්‍රම ලෙස දේශන, සාකච්ඡා විවාද යොදා ගැනීම.
- විෂයධාරා 5 ක් පැවතීම

ı.භාෂා විෂයධාරාව
2.දර්ශන විෂය ධාරාව
3.බුද්ධ ධර්මය විෂය ධාරාව
4.ලෞකික විෂය ධාරාව
5.ලලිතකලා විෂයධාරාව

- ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම
- කුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් උපාධි ප්‍රදානෝත්සවයක් උසස් ලෙස පැවැත්වීම
- ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම
- නාගාර්ජුන, ආර්යදේව, රාහුල භද්‍ර, අසංග, වාසු බන්ධු, දින්නාග, ශුභමති, ස්ථිරමති,චන්ද්‍රගෝපි, ධර්මපාල වැනි පඬිවරුන්ගේ සේවයද මෙහි සාර්ථකත්වයට බලපෑවේය. (ලකුණු 10)

7. i. ♦ මහින්දාගමනයට පෙර පැවති ඇදහිලි හා විශ්වාස ලෙස වෘක්ෂ වන්දනාව, යක්ෂ ඇදහීම, දේව වන්දනය, නාග වන්දනය, මළවුන් ඇදහීම, ග්‍රහවස්තු ඇදහීම දැක්විය හැකිය. බුදු දහම ලැබීමෙන් පසු ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ඇතැම් ඇදහිලි හා විශ්වාසයන්ට නව අරුතක් ගැන්වීමක් සිදු වූ අතර ඇතැම් ඒවා සම්පූර්ණයෙන්ම අභාවයට ගියේය.

- පේතවත්තු විමානවත්ථු බාලපණ්ඩිත දේවදූත යනාදී දේශනා ලක්වැසියන් අතර පැවැති දේව ඇදහීම හා මළවුන් ඇදහීමට නව අරුතක් ගැන්වීමකි.
- තිසාවැව අරක්ගත් යක්ෂයකු මිහිඳු හිමියන් විසින් දමනය කර බුදු සමයේ අනුග්‍රාහකයකු බවට පත්කර ඇත.
- දුටුගැමුණු රජු ස්වර්ණමාලී දෙව් දුව ගේ වාසස්ථානය පිහිටි තැන් ඉදිකළ මහා ස්තූපයට ස්වර්ණමාලී යන නම යෙදීය.
- පර්වත වන්දනය හා වෘක්ෂ වන්දනයට නව අරුත් ගැන්වූයේ ස්ථූප වන්දනය හා බෝධි වන්දනය හඳුන්වාදීමෙනි.
- මළවුන්ට හා දෙවියන්ට පින් දීමේ ක්‍රමය හඳුන්වා දුන්නේය.
- විනෝදයට දඩයමේයාම නැකැත් කෙළි වැනි දේ සපුරා අභාවයට ගිය අතර බෞද්ධාගමික උත්සව ආරම්භ විය.

ii. ♦රාජ්‍ය අනුශාසකවරු ලෙස භික්ෂූන් පත්විය දෙවනපෑතිස් හා උත්තිය රජුට මිහිඳු හිමියන් ද දුටුගැමුණු රජුට යෝධගත්ත තිස්ස හිමියන් ද සද්ධාතිස්ස රජුට කාල බුද්ධරක්ඛිත හිමියන් ද වලගම්බා රජුට තිස්ස හිමියන් ද කණිට්ඨතිස්ස රජුට මහානාග හිමියන්ද මහසෙන් රජුට සංඝමිත්ත හිමියෝද අනුශාසකවරු ලෙස ක්‍රියා කර ඇත.

- බුදුදහම ලංකාවේ රාජ්‍ය ආගම බවට පත්වීම
- රජකමට සුදුස්සා තෝරා ගැනීමේ බලය භික්ෂූන් සතු වීම රජු බෞද්ධයකු මෙන්ම බෝසත් වරයෙකු ද විය යුතු බව පිළිගැනීම
- බුදුදහමට එරෙහි පාලකයන්ට විරුද්ධව භික්ෂූන් තීරණ ගැනීම
- අභිෂේක උත්සවවලදී සෙත්පතා ඔටුනු පැළඳවීම
- බුදු සසුනට ලක්රජය පූජා කිරීම
- නුසුදුසු පාලකයන් සිහසුනනෙන් නෙරපාහැරීම
- දළදාව රැකීමට රජු ප්‍රතිඥා දීම
- බෞද්ධ දේශනා මූලධර්ම රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස ක්‍රියාවට නැංවීම (ලකුණු 10)

8. i. ♦ බුදුදහම රාජ්‍ය ආගම බවට පත්වීම

- සියලුම පිරිමින් තාවකාලික ව හෝ පැවිදි වීම අනිවාර්ය විය උපැවිදි වීම උත්සවාකාරයෙන් සිදු කරන අතර පැවිදි වීමේ සහතිකය විවාහයේදී හා රැකියා ලබා ගැනීමේදී වැදගත් විය.
- විවාහ මංගල චාරිත්‍ර භික්ෂූන්ගේ පිරිත් දේශනා අතරතුරදී සිදු කිරීම
- පන්සල ප්‍රජා මධ්‍යස්ථානය හා අධ්‍යාපන මධ්‍යස්ථානය වීම
- ගිහි ජනතාව දිනපතා විහාරස්ථානයට යාම අනිවාර්ය වීම
- දිනපතා උදෑසන පිණ්ඩපාත පූජා කිරීම
- බුදුදහමේ ආරක්ෂකයා ලෙස රජුට මල් පූජා කර ඉන් පසු බුදු පිළිමයට මල් පූජා කිරීම ජන ජීවිතයේ අංගයකි.
- කඨින පිංකමට රජය මුල් කවරකු හෝ අනිවාර්යෙන් සම්බන්ධ වේ.
- සියලු දෙනා කුඩා බුදුපිළිම පළඳනාවක් ලෙස පාවිච්චි කිරීම.
- දහස් ගණන් සිල්මෑණිවරු සිටීම.
- සියලු අවමංගල කටයුතු හා ආදාහන කටයුතු ආරාම වල සිදු කරයි.
- මලමිනී හා අලුත් විහාරස්ථානවල තැන්පත් කරන අතර ඒ සඳහා මුදල් ගෙවයි. (ලකුණු 10)

ii. ♦ ජනතාව අතර සාරධර්ම සංවර්ධනය සද'හා සිතුවම් ලෙස බෞද්ධ ජාතක කතා, පුදු සිරිත, බෝසත් සිරිත හා ශාසන ඉතිහාසය ද යොදාගෙන ඇත.

- බුද්ධ චරිතය ජාතක කතා ශ්‍රාවක චරිත බෞද්ධ ඉතිහාසය තේමා කරගෙන ජන හදවත් තුළට ආකල්ප සංවර්ධනයට චිත්‍ර කලාව යොදා ගෙන ඇත.
- විහාර මන්දිරවල චිත්‍ර තුළින් බුදු දහම පිළිබඳ දැනුම මෙන්ම චිත්ත සංථානය සාරධර්ම වලින් පෝෂණය කිරීමට හැකියාව ලැබේ.
- පාර්මිතා ගුණ ධර්ම සිතුවමට නැගීමෙන් ජනතාව තුළද එම ගුණධර්ම ඇති කිරීමට කලා කරුවා සමත් විය.
- දිව්‍යලෝක අපාය වැනි සංකල්ප සිතුවමට නැගීමෙන් එය නරඹන්නාගේ සිත් කුසලයට යොමු වේ.
- වෛරය ක්‍රෝධය වැනි මනෝභාවයන්ගේ භයානකකම සිතුවමට එක් කර ඇත.
- දරුණු පුද්ගලයන් දමනය කිරීම, වෙස්සන්තර ජාතකය සත්සති ගත කිරීම වැනි සිතුවම් තුළින් කුඩා ළමුන් පවා ආගම දහමට නැඹුරු කිරීමට කලාකරුවන් සමත්වී ඇත. (ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**
**Buddhist Civilization - II**

45 S II

පැය 03 යි
Two hours

විභාග අංකය:..................................................................

උපදෙස්:
- I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 කි. (1) (2) (3) ප්‍රශ්න වල එක් කොටසකට ලකුණු 4 බැගින් ද (4) (5) (6) (7) (8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින් ද හිමිවෙයි

## I කොටස

1. i. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව වෛශ්‍ය වර්ණයට නියමිත වූ ස්වධර්ම නම් කරන්න.
   ii. ආපද් ධර්ම හඳුන්වන්න.
   iii. බෞද්ධ නොවන ශ්‍රමණ ගුරුකුල හතරක් සැකෙවින් හඳුන්වන්න.
   iv. පූර්ණ කාශ්‍යප ශාස්තෘවරයාගේ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.
   v. බුද්ධ කාලීන භාරතයේ මගධ රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

2. i. බුදුරජාණන් වහන්සේ සතු වූ අෂ්ට විද්‍යා නම් කරන්න.
   ii. තාදී ගුණය නිදසුන් දෙකක් ඇසුරෙන් හඳුන්වන්න.
   iii. ශාසනික උන්නතිය සඳහා අනේපිඬු සිටුතුමාගෙන් සිදු වූ සේවය කෙටියෙන් දක්වන්න.
   iv. ''න භජේ පාපකේ මිත්තේ..'' යනාදී ධම්ම පද ගාථාව හා එහි තේරුම නිවැරදිව ලියන්න.
   v. සදිසා සංග්‍රහයට අනුව දකුණු දිසා නියෝජනයේ යුතුකම් හා වගකීම් නම් කරන්න.

3. i. දස අකුසල් නිවැරදිව නම් කරන්න.
   ii. සිව්බඹ විහරණ හඳුන්වන්න.
   iii. බුදු දහමෙහි උගන්වන ශ්‍රද්ධාව සැකෙවින් හඳුන්වන්න.
   iv. චෛතියඝරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   v. හොඳ නරක විනිශ්චය සඳහා යොදාග හැකි බෞද්ධ නිර්ණායක හතරක් ගෙනහැර දක්වන්න.

## II කොටස

4. i. වර්තමානයේ දැකිය හැකි පාරිසරික ගැටලු අවම කර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් උප උපයෝගී කරගත හැකි දැයි විමර්ශනය කරන්න.
   ii. සම්පත් කළමනාකරණය පිළිබඳ ව සැලකිලිමත් වීමේදී බෞද්ධ ඉගැන්වීම්වල ඇති උපයෝගීතාවය පරීක්ෂා කරන්න.
5. i. ''බෞද්ධ දේශපාලන මූලධර්ම සකස් වී ඇත්තේ සමාජ සුභසාධනය අරමුණු කරගෙනයි'' මෙම අදහස විමර්ශනය කරන්න.
   ii. පාලන තන්ත්‍රය විෂයෙහි ප්‍රජාවගේ වගකම් කෙබඳු විය යුතු දැයි පැහැදිලි කරන්න.

6. i. දෙවන ධර්ම සංගීතියට පාදක වූ කරුණු හඳුන්වා එහි ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි කෙසේ බලපෑවේදැයි පැහැදිලි කරන්න.
   ii. නාලන්දා විශ්වවිද්‍යාලය පිළිබඳ හැඳින්වීමක් කර එහි අධ්‍යාපනය සාර්ථක වීම සඳහා බලපාන ලද සාධක පැහැදිලි කරන්න.

7. i. මහින්දාගමනය නිසා එතෙක් ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස සඳහා නව අර්ථකථන ලැබුණු ආකාරය පෙන්වා දෙන්න.
   ii. අනුරාධපුර යුගයේ රාජ්‍යත්වය කෙරෙහි බුදු සමයේ බලපෑම කෙබඳු දැයි පරීක්ෂා කරන්න.

8. i. ථායි ජන ජීවිතයෙ කෙරෙහි බුදු සමයේ බලපෑම විමර්ශනය කරන්න.
   ii. බෞද්ධ සාරධර්ම සමාජගත කිරීමට සිතුවම් කලාව ප්‍රබල මාධ්‍යයක් ලෙස යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

Answer

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

45 | S | I, II

පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 3 | 2. 4 | 3. 5 | 4. 3 | 5. 5 | 6. 2 | 7. 1 | 8. 2 | 9. 3 | 10. 2 |
| 11. 4 | 12. 1 | 13. 2 | 14. 3 | 15. 5 | 16. 1 | 17. 3 | 18. 4 | 19. 2 | 20. 4 |
| 21. 5 | 22. 3 | 23. 2 | 24. 4 | 25. 1 | 26. 4 | 27. 5 | 28. 2 | 29. 5 | 30. 4 |
| 31. 5 | 32. 1 | 33. 3 | 34. 1 | 35. 2 | 36. 5 | 37. 1 | 38. 3 | 39. 2 | 40. 1 |
| 41. 4 | 42. 5 | 43. 1 | 44. 3 | 45. 1 | 46. 2 | 47. 3 | 48. 4 | 49. 2 | 50. 5 |

(ලකුණු 2 x 50 =100)

## ii කොටස

1. i. පශු පාලනය, දන්දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළඳාම, මුදල් පොලී කිරීම, කෘෂිකර්මාන්තය.

ii. හදිසි විපත්ති ලෙස බලපාන පොදු ආපදාපන්න තත්ත්වයන් හෝ ඒ ඒ වර්ණ වල සාමාජිකයන්ට තම වර්ණයට නිය නියමිත කටයුතු කිරීමට නොහැකි වූ කිසියම් ශාරීරික පීඩාවක් ඇති වූ අවස්ථා ආපදාපන්න අවස්ථා ලෙස හඳුන්වයි. එවැනි අවස්ථාවලදී කිරීමට නිර්දේශ කළ කාර්යයන් ''ආපද් ධර්ම'' ලෙස හඳුන්වයි.

- ♦ බ්‍රාහ්මණයාට තමාට වඩා පහත් ක්ෂත්‍රීය හා වෛශ්‍යයන්ට නියමිත කාර්යයන්හි නිරත විය හැකි ය.
- ♦ ක්ෂත්‍රීයන්ට තමාට වඩා පහත් ශ්‍රේණිය වූ වෛශ්‍යයන්ට හිමි කාර්යයන් කළ හැකිය.
- ♦ වෛශ්‍යයන්ට තමාට වඩා පහත් වූ ශුද්‍ර යන්ට හිමි කාර්යයයන් කළ හැකිය.
- ♦ ශුද්‍රයන්ට විශේෂ කාර්යයක් නොවූයේ මෙහි අවරෝහන පටිපාටිය ක්‍රියාත්මක වූ නිසාය.

iii. නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජක වැනි බෞද්ධ නොවන වෙනත් ශ්‍රමණ සාමාජිකයන් පිළිබඳ කෙටි හැඳින්වීමක් අපේක්ෂා කෙරේ.

iv. ♦ සාමඤ්ඤ ඵල සූත්‍රය පදනම් කර කරගෙන පිළිතුර සකස් විය යුතුය.

- ♦ පූර්ණ කස්සප අකිරිය වාදියෙකි, භෞතිකවාදියෙකි.
- ♦ කරන්නකු කරවන්නකු සිදින්නකු සිඳවන්නකු නැතැයි යන දර්ශනය අකිරියවාදයයි.
- ♦ සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැතැ යි උගන්වයි (නත්ථි පාපස්ස ආගමො)
- ♦ දන්දෙමින්, දන් දෙවමින්, ආගම යදිමින් යදවමින් ගංගා තීරයේ උතුරු කෙළවර තෙක් ගියත් එයින් පිනක් නැතැයි (නත්ථි පුඤ්ඤස්ස ආගමො) ඔහු ගන්වා ඇත.

v. රජගහනුවර මගධයේ අගනුවර විය. බිම්බිසාර හා අජාසත්ත යන රජවරු බුද්ධ කාලීන පාලකයන් විය.

- ♦ අංග කාසි වජ්ජි රාජ්‍යය ද යටත් ප්‍රදේශ බවට පත්විය.
- ♦ වේහාර වේපුල්ල ගිජ්ජකූට පාණ්ඩව යන පර්වත පහකින් යුක්ත වූ නිසා ගිරිබ්බජ යන නමින් ද ප්‍රකට විය.
- ♦ රාජාණ්ඩු පාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය.
- ♦ පළමු ආරාම පූජාව වේළුවනාරාමයයි.
- ♦ බුදුරදුන් සමග මගධ රාජ්‍යය සබඳතා පැවැත්විය. (ලකුණු 4X5=20)

2. i. විපස්සනා ඤාණය — මනෝමය ඍද්ධි ඤාණය

ඉද්ධිවිධ ඤාණය — දිබ්බසෝත ඤාණය

පරචිත්ත විජානන ඤානය — පුබ්බේනිවාසානුස්සති ඤාණය

දිබ්බචක්ඛු ඤාණය — ආසවක්ඛය ඤාණය

ii. ලෝක ධර්මතා විෂයෙහි කම්පා නොවී උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමේ හැකියාවයි.
අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණකි.
ලාභ අලාභ, යස අයස, නින්දා ප්‍රශංසා, සැප දුක යන අටලෝ දහමට බුදුරදුන් මුහුණ දුන් ආකාරය නිදසුන් මගින් දැක්වීම අවශ්‍ය වේ.

iii. බුදු රජාණන් වහන්සේ ඇසුරු කිරීම නිසා සැදැහැවත් බෞද්ධයකු බවට පත් විය.

- ♦ ජේතවනාරාමය සඟ සතු කර පූජා කිරීම
- ♦ දන් දීමේ ඇලුණු උවසුවන් අතර අග තනතුර ලැබීම,
- ♦ අනතිමානී කම, නිර්ලෝභී කම, ශාසන ලැදියාව හා ඥාති මිත්‍රාදීන් ආගම දහමට යොමු කිරීමට උත්සාහ කිරීම අගය කළ යුතුය

| | |
|---|---|
| iv. න භජේ පාපකේ මිත්තේ | පව්ටු නරක මිතුරන් ඇසුරු නොකළ යුතුය. |
| න භජේ පුරිසා ධමේ | අධම පහත් මිනිසුන් ඇසුරු නොකළ යුතුය. |
| භජේථ මිත්තේ කල්‍යාණෙ | කල්‍යාණ මිතුරන් ඇසුරු කළ යුතුය. |
| භජේත පුරිසුත්තමේ | උතුම් මිනිසුන් ඇසුරු කළ යුතුය. |

v. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම්

1. ගුරුවරයා දුටු විට හුන් අසුනින් නැගිටීම
2. ගුරුවරයාට උපස්ථාන කිරීම
3. ගුරු බස්ට මැනවින් සවන්දීම
4. ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටු කර දීම
5. මැනවින් ශිල්ප ඉගෙනීම

ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම්.

1. ශිෂ්‍යයා මැනවින් හික්මවීම
2. ශිෂ්‍යයාට මැනවින් ඉගැන්වීම
3. තමා දන්නා සියලු ශිල්ප ශාස්ත්‍රයන් ඉගැන්වීම
4. තම මිත්‍ර ජනයාට ශිෂ්‍යයා හඳුන්වාදීම
5. ශිෂ්‍යයා කරදරවලින් ආරක්ෂා කිරීම

(ලකුණු 4X5=20)

3. i. ප්‍රාණඝාතය, අදත්තාදානය, පරදාර සේවනය, මුසාවාදය, කේළාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය.

ii. ♦ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා, යන සිව් බඹ විහරණ බව
- ♦ සීමාවකින් තොරව වැඩිය යුතු බැවින් මෙම ගුණධර්ම අප්පමඤ්ඤා නමින් හඳුන්වයි.
- ♦ සමාජ සහජීවනයට උපකාරී වෙයි
- ♦ ගිහි පැවිදි දෙපක්ෂයම ශක්ති ප්‍රමාණයෙන් බ්‍රහ්ම විහාර ප්‍රගුණ කළ යුතුය.

iii. ♦ ආකාරවතී සද්ධාව හා අමූලිකා සද්ධාව ලෙස ප්‍රභේද දෙකකි.
- ♦ තෙරුවන් පිළිබඳ පැහැදීම ප්‍රසාදය ශ්‍රද්ධාවයි
- ♦ බුද්ධාදී රත්නත්‍රයේ ගුණ දැන අවබෝධයෙන් ඇතිකර ගන්නා පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාවයි
- ♦ අමූලික ශ්‍රද්ධාව භක්තිය හා සමානයි බුදුසමය එය අගය නොකරයි. එය නිවනට බාධාවකි
- ♦ බුදු දහම අගය කරන සද්ධාව ප්‍රඥාවෙන් තොර වූවක් නොවේ.

iv. ♦ කුඩා හා මධ්‍ය පරිමාණයේ ස්තූපයන්හි ආරක්ෂාව සඳහා ගල් කණු වලින් වට කොට ඒ මත පියස්සක් තනා ඉදිකළ වෘත්තාකාර ගෘහය චේතිය ඝර, ථූපඝර, යන නම්වලි වලින් හඳුන්වයි.
- ♦ ථූපාරාමය, ලංකාරාමය, අම්බස්තලය වැනි කුඩා ස්තූප වලට චෛත්‍යඝර ඉදිකර තිබූ බවට සාධක ඇත.
- ♦ චේතියඝරය වටදාගෙය නමින් හඳුන්වයි.
- ♦ මැදිරිගිරිය වටදාගෙය කලාත්මක නිර්මාණයක් ලෙස පිළිගැනේ
- ♦ මෙම නිර්මාණය නිසා ස්තූපයේ ආරක්ෂාව මෙන්ම සැදැහැවතුන්ට අව්වෙන් වැස්සෙන් ආරක්ෂා වී වැඳුම් පිදුම් කිරීමට හැකියාව ලැබේ.

v. ♦ යමක් කුසල් ද අකුසල් ද යන්න තමන් වී විසින් දැන ගැනීම.
- ♦ නුවණැත්තන් විසින් ගර්හාවට ලක් කරයිද ප්‍රශංසාවට ලක් කරයි ද යන්න වටහා ගැනීම් (විඤ්ඤූගරහිත විඤ්ඤූපසත්ථ)
- ♦ අධිපති ධර්ම අනුව:- අත්තාධිපති ලෝකාධිපති, ධර්මාධිපති,
- ♦ අත්තූපනායික ධර්ම පර්යාය (තමා උපමාවට ගෙන කටයුතු කිරීම)
- ♦ ප්‍රතිඵල යහපත් ද අයහපත් දැයි බලා තීරණය කිරීම
- ♦ අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය ඇසුරෙන් කරුණු දැක්වීම.

(ලකුණු 4X5=20)

4. i. ♦ වර්තමානයේ පාරිසරික ගැටලු ලෙස ජල දූෂණය, වායු දූෂණය, වන විනාශය, කැළි කසළ ගොඩ ගැසීම හඳුනාගත හැකිය. එමගින් ජීවන දුෂ්කරතා සිදුවේ.

**Answer**

- ♦ පිරිසිදු ජලය නොමැති වීම ද ගැටලුවකි.
- ♦ පරිසර සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් බොහෝ ඇත. ජලයට මුත්‍රා කිරීම, කෙළ ගැසීම, මළ පහ කිරීම තහනම් කර ඇත. (පාචිත්තිය පාලිය)
- ♦ ගස් කැපීම, බීජ විනාශ කිරීම, කොළ කැඩීම ආදිය උපසම්පදා භික්ෂූන්ට තහනම් කර ඇත (පාචිත්තිය පාලිය)
- ♦ නොකළ යුතු වෙළඳාම් කිරීම තුළින් පරිසර සංරක්ෂණයට බාධා සිදුවේ.
- ♦ පරිසර සංරක්ෂණය පින් වැඩෙන කුසල ලෙස වනරෝප සූත්‍රයේ සඳහන් කර ඇත.
- ♦ බුදුරජාණන් වහන්සේ ද රහතන් වහන්සේලා ද පරිසරය ප්‍රිය කර ඇත.

ii. ♦ භෞතික හා මානව සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගැනීම කළමනාකරණයයි
- ♦ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සමජීවිකතාවය තුළින් භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳව මගපෙන්වයි
- ♦ සිඟාලෝවාද සූත්‍රයේ දී ආර්ථික කළමනාකරණය පිළිබඳ මග පෙන්වයි (ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය)
- ♦ චුල්ලවග්ග පාලියේ වත්තක්ඛන්ධකයේ ආගන්තුක වත, පිණ්ඩ චාරික වත ආවාසිකවත, සේනාසන වත, වච්චකුටි වත ආදී වතාවත් තුළින් ද සම්පත් කළමනාකරණය පිළිබඳව භික්ෂූන්ට මගපෙන්වා ඇත.
- ♦ භික්ෂූන් උදෙසා සාංඝිකව ලැබෙන සම්පත් අවශ්‍යතා මත සුදුසු භික්ෂූන්ට පැවරීම.
- ♦ භෞතික සම්පත් මැනවින් කළමනාකරණය කිරීම් සඳහා භාණ්ඩාගාරික භත්තුද්දේසක සිවාභාජක, චීවර පටිග්ගහක, පත්තගහාපක ආදී තනතුරු රැසක් භික්ෂු සමාජය තුළ ඇති කළේ ය. මානව සම්පත් කළමනාකරණය ද බුදුරදුන් මැනවින් සිදු කළ බව ප්‍රථම ධර්මදූත සේවාව සඳහා ලබාදුන් උපදේශනයෙන් ද පෙනේ. (චරථ භික්ඛවේ චාරිකං...)

(ලකුණු 10)

5. i. ♦ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව මහා සම්මත පත් කරන්නේ ජනතාවගේ ආරක්ෂාව හා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහාය
- ♦ ශ්‍රේෂ්ඨ පාලකයකු විසින් අනුගමනය කළ යුතු පාලන මූලධර්ම රැසක් බුදු දහමෙහි සඳහන් කර ඇත.
- ♦ පංචශීල ප්‍රතිපදාව දසරාජ ධර්මය, දස සක්විති වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය යන මූලධර්ම වැදගත් වේ.
- ♦ මෙම මූලධර්ම වලින් සමාජ සුභ සුබසාධනය අරමුණු කර ඇත. (ලකුණු 10)

ii. ♦ රටක් දියුණු කිරීමේදී පාලකයා පමණක් නොව ජනතාවට ද වැදගත් කාර්යභාරයන් ඉටු කිරීමට සිදුවෙයි.
- ♦ අග්ගඤ්ඤ සූත්‍රයේ රජුන් පත් කිරීමේ පළමු සම්මුතියෙහි පොරොන්දුවී ඇත්තේ (අම්හා කං සාලිනං භාගං අනුප්පදස්සාම) යනුවෙනි. ජනතාව නිසි පරිදි බදු ගෙවිය යුතු බව ඉන් කියවේ.
- ♦ තමන්ගේ ආර්ථික ස්වයං පෝෂණය සඳහා උත්සාහයෙන් අධිෂ්ඨානයෙන් ක්‍රියා කිරීම ජනතාවගේ වගකීමයි.
- ♦ පොදු දේපොළ නොසැලකිල්ලෙන් පරිහරණය නොකළ යුතුය.
- ♦ රාජ්‍ය දේපළ අයථා පරිහරණය හා අව භාවිතයෙන් තොර විය යුතුය.
- ♦ සම්පත් අධිපරිභෝජනයෙන් වැළකී සම්පත් ආරක්ෂා කිරීම ජනතා වගකීමකි.
- ♦ ආත්මාර්ථයෙන් තොරව සමාජ සුභ සිද්ධිය පිළිබඳව අවබෝධයෙන් ක්‍රියා කළ යුතුයි. (ලකුණු 10)

6. i. ♦ චුල්ලවග්ගපාලියේ සත්ත සතිකක්ඛන්ධකයට අනුව දෙවන ධර්ම සංගීතියට ආසන්න හේතුව වූයේ වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දස වස්තුවයි.
- ♦ පාචීනක, පාවෙය්‍යක යන ප්‍රදේශ දෙකෙන් ධර්ම ධර, විනය ධර භික්ෂූන් වහන්සේ කිනම් ප්‍රදේශයේ ද යන ගැටලු ද මතු විය.
- ♦ බුද්ධ ක්ෂේත්‍ර පිළිබඳ ගැටලු ඇති විය.
- ♦ මහාදේව හිමියන් ඉදිරිපත් කළ පංචවස්තුව ද හේතු වූ බව නිකායාවලම්බන ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ සඳහන් වේ.
- ♦ දෙවන ධර්ම සංගීතියේ ප්‍රධානම ප්‍රතිඵලය වූයේ වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දස වස්තුව සබ්බකාමී මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රැස්වූ සංඝ සම්මේලනයේදී ධර්ම විනය විරෝධී අකැප වස්තුවක් සේ එකින් එක විශ්ලේෂණය කර ප්‍රතික්ෂේප කිරීමයි.
- ♦ දස වස්තු ප්‍රතිග්‍රහක දස දහසක් භික්ෂූන් අලජ්ජි පාපී භික්ෂූන් ලෙස නිගමනය කොට සසුනෙන් නෙරපීය.
- ♦ වජ්ජිපුත්තක භික්ෂූන් වෙන්ව ගොස් මහා සාංඝික නමින් වෙනම නිකායක් පිහිටුවීය.
- ♦ ථෙරවාදී හා මහා සාංඝික නිකා දෙක තුළින්ද තවත් නිකා බෙදී ගියේය.
- ♦ නැවත මහා සාංඝිකයන් නිකාය (6) කට ද ථෙරවාදී නිකාය (12) කට ද ලෙස නිකාය 18 කට බෙදී ගියේය.
- ♦ මහායාන බුදුදහමේ මූලාරම්භය දෙවන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් අනුව සිදුවිය. (ලකුණු 10)

ii. ♦ ක්‍රිස්තු වර්ෂ 415 - 455 කාලයේ රජ කළ ශක්‍රාදිත්‍ය හෙවත් පළමුවන කුමාරගුප්ත රජු නාලන්දාවට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකර උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් කළේය
- ♦ බුද්ධගුප්ත තථාගත ගුප්ත යන රජවරු ද නාලන්දාව දියුණු කළේය.
- ♦ ක්‍රි.ව. හත්වන සියවස වන විට දස දහසකට නේවාසික පහසුකම් පැවැතියේ ය.
- ♦ හියුංසියැං අනුව සංඝාරාම හයකින් යුක්ත වූ මේ ආයතනය උස් තාප්පයකින් වට කොට තිබිණි තට්ටු (9) කින් හා මන්දිර තුනකින් යුතු පුස්තකාලය රත්න සාගර, රත්නෝදය රත්න රංජන, නම්වලින් හඳුන්වා ඇත.
- ♦ ආචාර්ය ශිෂ්‍ය සේවක යන නේවාසික පිරිස් (10,000) කට අධික වූ අතර එක්දහස් පන්සියයකට අධික සේවක පිරිසක් සිටි බව හියුං සියැං වාර්තා වල සඳහන් වෙයි.
- ♦ අධ්‍යාපනය අංශ තුනක් යටතේ සිදුවිය.
- ♦ ද්වාර පණ්ඩිතවරු මගින් ප්‍රවේශ විභාගයකින් සිසුන් තෝරා ගනු ලැබීය.
- ♦ ඉගෙනුම් ක්‍රම ලෙස දේශන, සාකච්ඡා, විවාද, යොදා ගැනීම.

- ♦ විෂයධාරා 5 ක් පැවතීම
    1.භාෂා විෂයධාරාව
    2.දර්ශන විෂය ධාරාව
    3.බුද්ධ ධර්මය විෂය ධාරාව
    4.ලෞකික විෂය ධාරාව
    5.ලලිතකලා විෂයධාරාව
- ♦ ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම
- ♦ කුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් උපාධි ප්‍රදානෝත්සවයක් උසස් ලෙස පැවැත්වීම
- ♦ ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම
- ♦ නාගාර්ජුන, ආර්යදේව, රාහුල භද්‍ර, අසංග, වාසු බන්ධු, දින්නාග, ගුණමති, ස්ථිරමති,චන්ද්‍රගෝමී, ධර්මපාල වැනි පඬිවරුන්ගේ සේවයද මෙහි සාර්ථකත්වයට බලපෑවේය. (ලකුණු 10)

7. i. ♦ මහින්දාගමනයට පෙර පැවති ඇදහිලි හා විශ්වාස ලෙස වෘක්ෂ වන්දනාව, යක්ෂ ඇදහීම, දේව වන්දනය, නාග වන්දනය, මළවුන් ඇදහීම, ග්‍රහවස්තු ඇදහීම දැක්විය හැකිය. බුදු දහම ලැබීමෙන් පසු ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ඇතැම් ඇදහිලි හා විශ්වාසයන්ට නව අරුතක් ගැන්වීමක් සිදු වූ අතර ඇතැම් ඒවා සම්පූර්ණයෙන්ම අභාවයට ගියේය.
- ♦ පේතවත්ථු විමානවත්ථු බාලපණ්ඩිත දේවදූත යනාදී දේශනා ලක්වැසියන් අතර පැවැති දේව ඇදහීම හා මළවුන් ඇදහීමට නව අරුතක් ගැන්වීමකි.
- ♦ තිසාවැවට අරක්ගත් යක්ෂයකු මිහිඳු හිමියන් විසින් දමනය කර බුදු සමයේ අනුග්‍රාහකයකු බවට පත්කර ඇත.
- ♦ දුටුගැමුණු රජු ස්වර්ණමාලී දෙව් දුව ගේ වාසස්ථානය පිහිටි තැන ඉදිකළ මහා ස්තූපයට ස්වර්ණමාලී යන නම යෙදීය.
- ♦ පර්වත වන්දනය හා වෘක්ෂ වන්දනයට නව අරුත් ගැන්වූයේ ස්තූප වන්දනය හා බෝධි වන්දනය හඳුන්වාදීමෙනි.
- ♦ මළවුන්ට හා දෙවියන්ට පින් දීමේ ක්‍රමය හඳුන්වා දුන්නේය.
- ♦ විනෝදයට දඩයමේයාම නැකැත් කෙළි වැනි දේ සපුරා අභාවයට ගිය අතර බෞද්ධාගමික උත්සව ආරම්භ විය.

ii. ♦රාජ්‍ය අනුශාසකවරු ලෙස භික්ෂූන් පත්විය දෙවනපෑතිස් හා උත්තිය රජුට මිහිඳු හිමියන් ද දුටුගැමුණු රජුට යෝධගත්ත තිස්ස හිමියන් ද සද්ධාතිස්ස රජුට කාල බුද්ධරක්ඛිත හිමියන් ද වලගම්බා රජුට තිස්ස හිමියන් ද කණිට්ඨතිස්ස රජුට මහානාග හිමියන්ද මහසෙන් රජුට සංඝමිත්ත හිමියෝද අනුශාසකවරු ලෙස ක්‍රියා කර ඇත.
- ♦ බුදුදහම ලංකාවේ රාජ්‍ය ආගම බවට පත්වීම
- ♦ රජකමට සුදුස්සා තෝරා ගැනීමේ බලය භික්ෂූන් සතු වීම රජු බෞද්ධයකු මෙන්ම බෝසත් වරයෙකු ද විය යුතු බව පිළිගැනීම
- ♦ බුදුදහමට එරෙහි පාලකයන්ට විරුද්ධව භික්ෂූන් තීරණ ගැනීම ♦ අභිෂේක උත්සවවලදී සෙත්පතා ඔටුනු පැළඳවීම
- ♦ බුදු සසුනට ලක්රජය පූජා කිරීම ♦ නුසුදුසු පාලකයන් සිහසුනෙන් නෙරපාහැරීම
- ♦ දළදාව රැකීමට රජු ප්‍රතිඥා දීම
- ♦ බෞද්ධ දේශපාලන මූලධර්ම රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස ක්‍රියාවට නැංවීම (ලකුණු 10)

8. i. ♦ බුදුදහම රාජ්‍ය ආගම බවට පත්වීම
- ♦ සියලුම පිරිමින් තාවකාලික ව හෝ පැවිදි වීම අනිවාර්ය විය උපැවිදි වීම උත්සවාකාරයෙන් සිදු කරන අතර පැවිදි වීමේ සහතිකය විවාහයේදී හා රැකියා ලබා ගැනීමේදී වැදගත් විය.
- ♦ විවාහ මංගල චාරිත්‍ර භික්ෂූන්ගේ පිරිත් දේශනා අතරතුරදී සිදු කිරීම
- ♦ පන්සල ප්‍රජා මධ්‍යස්ථානය හා අධ්‍යාපන මධ්‍යස්ථානය වීම
- ♦ ගිහි ජනතාව දිනපතා විහාරස්ථානයට යාම අනිවාර්ය වීම
- ♦ දිනපතා උදෑසන පිණ්ඩපාත පූජා කිරීම
- ♦ බුදුදහමේ ආරක්ෂකයා ලෙස රජුට මල් පූජා කර ඉන් පසු බුදු පිළිමයට මල් පූජා කිරීම ජන ජීවිතයේ අංගයකි.
- ♦ කඨින පිංකමට රජය පවුලේ කවරකු හෝ අනිවාර්යෙන් සම්බන්ධ වේ.
- ♦ සියලු දෙනා කුඩා බුදුපිළිම පළඳනාවක් ලෙස පාවිච්චි කිරීම.
- ♦ දහස් ගණන් සිල්මෑණිවරු සිටීම.
- ♦ සියලු අවමංගල කටයුතු හා ආදාහන කටයුතු ආරාම වල සිදු කරයි.
- ♦ මළමිනී හා අළුවිහාරස්ථානවල තැන්පත් කරන අතර ඒ සඳහා මුදල් ගෙවයි. (ලකුණු 10)

ii. ♦ ජනතාව අතර සාරධර්ම සංවර්ධනය සඳ'හා සිතුවම් ලෙස බෞද්ධ ජාතක කතා, පුදු සිරිත, බෝසත් සිරිත හා ශාසන ඉතිහාසය ද යොදාගෙන ඇත.
- ♦ බුද්ධ චරිතය ජාතක කතා ශ්‍රාවක චරිත බෞද්ධ ඉතිහාසය තේමා කරගෙන ජන හදවත් තුළට ආකල්ප සංවර්ධනයට චිත්‍ර කලාව යොදා ගෙන ඇත.
- ♦ විහාර මන්දිරවල චිත්‍ර තුළින් බුදු දහම පිළිබඳ දැනුම මෙන්ම චිත්ත සන්තානය සාරධර්ම වලින් පෝෂණය කිරීමට හැකියාව ලැබේ.
- ♦ පාරමිතා ගුණ ධර්ම සිතුවමට නැගීමෙන් ජනතාව තුළද එම ගුණධර්ම ඇති කිරීමට කලා කරුවා සමත් විය.
- ♦ දිව්‍යලෝක අපාය වැනි සංකල්ප සිතුවමට නැගීමෙන් එය නරඹන්නාගේ සිත් කුසලයට යොමු වේ.
- ♦ වෛරය ක්‍රෝධය වැනි මනෝභාවයන්ගේ භයානකකම සිතුවමට එක් කර ඇත.
- ♦ දරුණු පුද්ගලයන් දමනය කිරීම, වෙස්සන්තර ජාතකය සත්සති ගත කිරීම වැනි සිතුවම් තුළින් කුඩා ළමුන් පවා ආගමදහමට නැඹුරු කිරීමට කලාකරුවන් සමත්වී ඇත. (ලකුණු 10)

LOL.lk

Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

**071 777 4440**